# ආහාර සුරක්ෂිතතාවය සහ දරිද්‍රතාවය තුරන් කිරීමේ සංදර්භය තුළ සුළුපන්න ධීවර කර්මාන්තයේ තිරසරභාවය සහතික කිරීම සඳහා වූ සුළුපන්න ධීවර මඟපෙන්වීම් මාලාව

## අරමුණු

**සුළුපන්න ධීවර කර්මාන්තයේ තිරසරභාවය සහතික කිරීම සඳහා සුළුපන්න ධීවර මඟපෙන්වීම් මාලාවේ අරමුණු :**

- ගෝලීය ආහාර සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය කිරීම.
- පෘථිවියේ සමාජ සහ ආර්ථිකයේ අනාගතය ප්‍රවර්ධනය සඳහා සුළුපන්න ධීවර කර්මාන්තයේ දායකත්වය දිරිගැන්වීම.
- ධීවර කාර්මිකයන්ගේ සමාජ ආර්ථික තත්වය වර්ධනය සඳහා දායකවීම.
- ධීවර සම්පත්වල තිරසර භාවිතය ළඟාකර ගැනීම.

## මඟපෙන්වීමේ මූලධර්ම

### 1. වගකීමක් සහිත භුක්තියේ පාලනය

අදාළ සම්පත් වල භුක්තිය වගකීමක් සහිතව පාලනය කිරීම, සුළුපන්න ධීවර කාර්මිකයන්ගේ මානව හිමිකම් සහ සමාජ ආර්ථික සහ සංස්කෘතික අයිතීන් සාක්ෂාත් කර ගැනීම සඳහා වන කේන්ද්‍රීය කරුණ වේ. සුළුපන්න ධීවර ප්‍රජාවන්ට සුරක්ෂිත, සමානාත්මතාවයෙන් යුතු, සමාජීය හා සංස්කෘතික යෝග්‍යතාවයෙන් යුතු වූ ධීවර සම්පත් වල භුක්තියේ අයිතියත් ධීවර ප්‍රදේශයන් සහ යාබදව පිහිටන ඉඩම් හා වනාන්තර වල භුක්තියේ අයිතියත් පැවතිය යුතුය.

මෙහි දී කාන්තාවන්ගේ භුක්තියේ අයිතිය පිළිබඳව විශේෂ අවධානයක් යොමුකළ යුතුය. සියලුම ආකාරයේ නිත්‍යානුකූල භුක්තියේ අයිතිය පිළිබඳව හඳුනාගත යුතු අතර ඒවා වාර්තාගත කර අනුගමනය කළ යුතුය.

අවශ්‍ය වේ නම් මේවා අතර විශේෂයෙන් සැලකිලිමත් විය යුත්තේ පාරම්පරික හා විශේෂ අවධානයකින් යුතු ජලජ සම්පත් සහ ඉඩම් පිළිබඳ අයිතියත්, ස්වදේශීය ජනයා මෙන්ම ජනවාර්ගික සුළුතරයන්ගේ අයිතීන් පිළිබඳවයි.

නීතිමය ප්‍රතිසංස්කරණයන් කාන්තාවන්ගේ අයිතීන් වලට පටහැනිවේ නම් ඒවා යෝග්‍ය පරිදි පාරම්පරික භුක්තියේ අයිතීන් තුළ ඉඩකඩ ලබාදිය යුතුය.

ජලජ සහ වෙරළාසන්න පරිසර පද්ධතීන් ප්‍රතිස්ථාපනයට, සංරක්ෂණයට, සුරක්ෂිතතාවයට සහ සහකළමනාකරණයට සුළුපන්න ධීවර ප්‍රජාවන්ට සහ ස්වදේශීය ජනයාට ඇති කාර්යය භාරය හඳුනාගත යුතුය.

විශේෂයෙන්ම සුළුපන්න ධීවර ප්‍රජාව සාමූහිකව කළමනාකරණය කරනවිට දී සමාජ ආර්ථික සහ පාරිසරික අරමුණු සැලකිල්ලට ගනිමින් රාජ්‍යයේ අයිතිය සතු හෝ පාලනය කරන ඉඩම් හෝ ජලජ සම්පත් පිළිබඳ භුක්තියේ අයිතිය ස්ථාපිත කළ යුතුය.

සුළුපන්න ධීවරයින්ට ජාතික ජල තීරයේ ධීවර කටයුතුවල නිරතවීම සඳහා සුවිශේෂී වූ ප්‍රවිෂ්ටයට ඉඩ ලබාදිය යුතුය. තෙවන පාර්ශ්වයන්ට සම්පත් සඳහා ප්‍රවිෂ්ටයේ අයිතිය ලබාදෙන ගිවිසුම් වලට එළඹීමට පෙර සුළුපන්න ධීවර ප්‍රජාවන්ගේ මෙම ප්‍රදේශ සඳහා ඇති ඉල්ලීම් පිළිබඳව නිසි අවධානය යොමුකළ යුතුය.

වෙනත් සම්පත් භාවිතා කරන්නන්ද සිටින විටදී සුළුපන්න ධීවර ප්‍රදේශවල සිදුවන තරගකාරිත්වයේ වර්ධනය නිසා ගැටුම්කාරිත්වයන්ට යොමුවිය හැකිය. මෙවැනි අවස්ථාවන්හි දී සුළුපන්න ධීවර ප්‍රජාවන් පිළිබඳව විශේෂ සහයක් ලබාදීම සිදුකළ යුතු අතර ඔවුන්ව නීති විරෝධී ආකාරයෙන් පන්නා දැමීමට හෝ නීත්‍යානුකූල භුක්තියේ අයිතීන් නොතකා ක්‍රියාකිරීමට හෝ විනාශකිරීම සිදු නොකළ යුතුය.

විශාල පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘතීන් සිදුකිරීමේ දී රාජ්‍යයන් සහ අනෙකුත් පාර්ශ්වයන් විසින් සුළුපන්න ධීවර ප්‍රජාවන් සමග අර්ථාන්විතව සාකච්ඡා කළ යුතු අතර සුළුපන්න ධීවර ප්‍රජාවන්ට එකී ව්‍යාපෘතීන් වල බලපෑම ද අධ්‍යයනය කිරීම සිදුකළ යුතුය.

සුළුපන්න ධීවර ප්‍රජාවගේ භුක්තියේ අයිතීන් පිළිබඳව හටගන්නා අර්බුධයන්හි දී එකී අර්බුධ කාලීනවත් දැරිය හැකි මිලකට මෙන්ම කාර්යක්ෂම ආකාරයෙන් විසඳිය යුතු අතර වන්දි ගෙවීම හෝ උරුම කරුට ආපසු ලබාදීම, අලාභ හානි සඳහා වන්දි ගෙවීම ආදිය කඩිනමින් සිදුකළ යුතුය.

ස්වාභාවික ආපදා නිසා හෝ යුධමය වාතාවරණයන් නිසා සිදුවන අවතැන්වීම් නිසා සුළුපන්න ධීවරයින්ට සිදුවන බලපෑම වර්ධනය වෙමින්

පවතී. ධීවර සම්පත් වල තිරසර භාවය සැලකිල්ලට ගනිමින් පාරම්පරික ධීවර බිම්වලට සහ වෙරළාසන්න භූමිවලට ප්‍රවිෂ්ට වීමට ඇති අයිතිය යලි ස්ථාපිත කිරීම සඳහා රාජ්‍යයන් සියලු ප්‍රයත්නයන් දැරිය යුතුය. මෙවැනි අවස්ථාවල දී දැඩි මානව හිමිකම් උල්ලංඝණායට ලක්වූ ප්‍රජාවන්ට තම ජීවිත යලි ගොඩනැගීම සඳහා සහය වීම සඳහා යාන්ත්‍රණයක් සැකසීමත් කාන්තාවන්ට සිදුකරන සියලු ආකාරයේ භුක්තියේ අයිතිය උල්ලංඝණය වීමෙන් සිදුවන අසාධාරණායන් පිටුදැකීම සිදුකළ යුතුය.

## 2. තිරසර සම්පත් කළමනාකරණය

සුළුපන්න ධීවර කර්මාන්තයේ දිගුකාලීන සංරක්ෂණයත් ධීවර සම්පත්වල තිරසර භාවිතය සඳහාත් අවශ්‍ය පියවර ගතයුතු අතර එහි දී සුළුපන්න ධීවර කර්මාන්තයේ අවශ්‍යතාවයන් සහ අවස්ථාවන් හඳුනා ගනිමින් මේ සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

අයිතින් හා වගකීම් එක්ව ගමන් කරනු ඇත. ඔබ යම් සම්පතක් භුක්ති විඳින්නේ නම් එම සම්පත සංරක්ෂණය කිරීමේ සහ තිරසර භාවිතය සඳහා ඇති වගකීම ද ඔබ සතුය.

සුළුපන්න ධීවර කර්මාන්තයේ දී භාවිතා කරන ධීවර ක්‍රියාමාර්ගයන් නිසා පරිසරයට සහ ආශ්‍රිත මත්ස්‍ය විශේෂයන්ට වන හානිය අවම කළ යුතුය.

සම්පත් කළමනාකරණයේ දී ඒ සඳහා සුළුපන්න ධීවරයන්ට වගකීම ගත හැකිවන පරිදි රජය ඔවුන්ට සහය විය යුතුය.

කළමනාකරණය සැලසුම් කිරීම හෝ නිර්මාණය සිදු කිරීමේදී ධීවර ප්‍රජාව සහභාගි කරගත යුතු වන අතර එය කාන්තාවන් සහ තර්ජන වලට පාත්‍ර පාර්ශවකරුවන් ද ඇතුලත් වන පරිදි සමාන සහභාගිත්වයක් තහවුරු කරමින් සිදු කිරීමට වග බලා ගත යුතුය.

දැනට ඇති රාජ්‍ය නීති රාමුව තුළ සහභාගිත්ව කළමනාකරණ ක්‍රියාවලින් ප්‍රවර්ධනය කළ යුතුය. සුළුපන්න ධීවර කාර්මිකයන්ට ගැළපෙන පරිදි හා අදාළ පරිදි වන අධීක්ෂණ, පාලන සහ ආවේක්ෂණ ක්‍රියාවලීන් රාජ්‍යයන් විසින් ස්ථාපිත කර දිරිගැන්විය යුතුය.

කළමනාකරණය සඳහා අවශ්‍ය තොරතුරු ලබාදෙමින් සුළුපන්න ධීවරයින් අධීක්ෂණ, පාලන හා ආවේක්ෂණ ක්‍රියාවලියට සහය විය යුතු අතර රාජ්‍යයන් විසින් සියලුම නීති විරෝධී සහ විනාශකාරී ධීවර ක්‍රියාවලීන් පිටුදැකීම, වැළැක්වීම සහ මර්දනය කිරීම ඉලක්ක කරගනිමින් ක්‍රියාකළ යුතුය.

සහ-කළමනාකරණ ක්‍රියාකාරිත්වයන් වල දී සියලුම පාර්ශ්වයන්ට ඇති වගකීම හා කාර්යභාරය රජය විසින් අවශ්‍ය නීතිමය සහය ලබාදෙමින් ඔවුන්ට මනාව වටහා දිය යුතුය.

සුළුපන්න ධීවර කාර්මිකයින්, ඔවුන්ට අදාළවන සියලුම ප්‍රාදේශීය හා ජාතික වෘත්තීයමය සංගම් සහ ස්ථාන නියෝජනය කරමින් තම ධීවර කාර්යයන්ට අදාළ තීරණ ගැනීමේ හා ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලියේ දී ක්‍රියාකාරීව දායක විය යුතුය.

සහ කළමනාකරණය දිරිගන්වමින්, රාජ්‍යයන් හා සුළුපන්න ධීවර ක්ෂේත්‍ර ක්‍රියාකාරීන් යන දෙපාර්ශ්වයම අස්වනු නෙළීමට අමතරව පූර්ව හා පශ්චාත් අස්වනු නෙළීමේ ක්‍රියාවලියේ දී පිරිමින් හා කාන්තාවන් දෙපාර්ශ්වයටම ඔවුන්ගේ දැනුමට දැක්මට හා අවශ්‍යතාවයන්ට සහය දැක්විය යුතුය. විශේෂයෙන්ම ජලය හා ආශ්‍රිත සම්පත් යාබද රටවල් සමඟ බෙදාහදා ගන්නා අවස්ථාවල දී සුළුපන්න ධීවර ප්‍රජාවන්ගේ භුක්තියේ අයිතිය සුරක්ෂිත කෙරෙන බවට සහතික විය යුතුය.

සුළුපන්න ධීවර ප්‍රජාවන්ට අහිතකර බලපෑමක් ඇති කරන ධීවර සම්පත් අධි සූරාකෑමට ලක්කෙරෙන පරිදි ධීවර සම්පත් නෙළීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැපයීමෙන් හෝ ප්‍රතිපත්ති සැකසීමෙන් වැලකිය යුතුය.

## 3. සමාජ සංවර්ධනය, රැකියා අවස්ථාවන් සහ යෝග්‍ය (වැදගත්) කාර්‍යයන්

සුළුපන්න ධීවර සම්පත් කළමනාකරණයේ දී හා සංවර්ධනයේ දී සියලුම පාර්ශ්වයන් විසින් සාර්ව ක්‍රියාකාරිත්වයක් (පූර්ණ දැක්මක් - එනම් සියළු අවශ්‍යතා දෙස එකවර බැලීම) අනුගමනය කළ යුතුය.

රාජ්‍යයන් විසින් සෞඛ්‍යය, අධ්‍යාපනය, සාක්ෂරතාවය, ඩිජිටල් තාක්ෂණය සහ අනෙකුත් තාක්ෂණික හැකියාවන් දිරිගැන්වීම සඳහා ආයෝජනයන් සිදුකළ යුතුය.

සමස්ථ අගය දාමයම අන්තර්ගතවන පරිදි සුළුපන්න ධීවර ක්‍රියාවලියේ ඇති සියලුම අවස්ථාවන්ට අදාළ වන පරිදි සමාජ ආරක්ෂණ විධිවිධාන සලසා දීමට රාජ්‍යයන් විසින් පියවර ගත යුතුය. මෙම ක්‍රියාවලියේ දී කාන්තාවන් සහභාගි කරවා ගැනීමට විශේෂ අවධාරණයක් යොමු කරමින් ඉතිරි කිරීම්, ණය සහ රක්ෂණ ක්‍රියාවලියක් සැකසීම සඳහා රාජ්‍යයන් විසින් සහය විය යුතුය.

සුළුපන්න ධීවර අගය දාමයේ ඇති විවිධ ක්‍රියාකාරීත්වයන් ආර්ථික හා වෘත්තිමය ක්‍රියාකාරකම් බව සියල්ලන් විසින් හඳුනා ගත යුතුය.

ප්‍රමාණවත් ජීවන මට්ටමක් භුක්ති විඳීම සඳහා ධීවර වෘත්තිකයන්ට ඇති අයිතිය සහතික කිරීම සඳහා පියවර ගත යුතුය.

රාජ්‍යයන් විසින් සියල්ලන් ඇතුලත් වන, අසාධාරණයන් සිදුනොවන සහ යෝග්‍ය ආර්ථික ප්‍රතිපත්තීන් සැකසීම මගින් තමන්ගේ ශ්‍රමයට, ආයෝජනයට සහ කළමනාකරණයට සාධාරණයක් ඉටුවන ආදායමක් සුළුපන්න ධීවරයින්ට ලබාදීමට පියවර ගත යුතුය.

රාජ්‍යයන් සහ අනෙකුත් සියලු පාර්ශ්වයන් විකල්ප ආර්ථික ආදායම් මාර්ග සම්පාදනයට සහය වීම සඳහා පියවර ගත යුතුය. සුළුපන්න මෙන්ම අනෙකුත් ධීවර ප්‍රජාවන්ට ධීවර ආශ්‍රිත ක්‍රියාකාරකම් දියත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් නිර්මාණය කර දිය යුතුය.

සංක්‍රමණය, ධීවරයින්ගේ පොදු ජීවන මාර්ග උපාය මාර්ගයකි. ධීවරයින් දේශ සීමා උල්ලංඝනය කරමින් මසුන් ඇල්ලීම සඳහා ඇති හේතු හඳුනා ගෙන ඒවා විසඳීම සඳහා රාජ්‍යයන් පියවර ගත යුතුය.

වෘත්තියේ නියැලීමේ දී සෞඛ්‍යය, ආරක්ෂාව සහ යෝග්‍ය රැකියා පසුබිම සම්බන්ධ කරුණු පිළිබඳ ගැටලු විසඳීමට රාජ්‍යයන් පියවර ගත යුතුය. බලහත්කාරයෙන් ශ්‍රමය භාවිතා කිරීම පිළිබඳ ගැටලුව සහ ණය බර මත ශ්‍රමය බැඳ තබාගැනීමේ ගැටලු පිටුදැකීම සඳහා රාජ්‍යයන් පියවර ගත යුතුය.

ධීවර දරුවන්ගේ අනාගතය සඳහාත්, යහ පැවැත්මටත් අධ්‍යාපනයේ ඇති වැදගත්කම හඳුනාගනිමින් පාසැල් සඳහා ප්‍රවේශයටත් අධ්‍යාපන පහසුකම් සැපයීමටත් රාජ්‍යයන් විසින් පියවර ගත යුතුය.

මහ මුහුදේ දී සහ අභ්‍යන්තර ජලාශවල දී ආරක්ෂාව පිළිබඳ ඇති සංකීර්ණතාවය සහ ඒවා ප්‍රමාණවත් නොවීමට බලපා ඇති බහුවිධ හේතූන් සියලුම පාර්ශ්වයන් විසින් හඳුනා ගත යුතුය. ධීවරයින්ගේ වෘත්තිමය සෞඛ්‍යය හා ආරක්ෂාව පිළිබඳව කරුණු සාමාන්‍ය ධීවර කළමනාකරණ ක්‍රියාවලීන් තුළට අනුගත කළ යුතුය.

ආයුධ සන්නද්ධ ගැටුම්කාරී වාතාවරණයන්හි දී සුළුපන්න ධීවර කර්මාන්තයේ නියැලි විවිධ පාර්ශවකරුවන්ගේ මානව හිමිකම් සහ මානව ගරුත්වය ආරක්ෂා කිරීමට රාජ්‍යයන් විසින් පියවර ගත යුතුය.

## 4. අගය දාමයන්, පසු අස්වනු ක්‍රියාවලීන් හා වෙළඳාම

සියලුම පාර්ශ්වයන් විසින් සුළු පන්න ධීවර කර්මාන්තයේ පසු අස්වනු උප අංශයේ කාර්යය භාරය හඳුනාගත යුතුය. පසු අස්වනු උප අංශයේ දී කාන්තාවන් අතිශය වැදගත් මෙහෙයක් ඉටුකරන අතර මෙම කරුණ සියල්ලන් විසින් හඳුනාගත යුතුය.

පසු අස්වනු උප අංශයේ ධාරිතා (නිපුණතා/හැකියා) වර්ධනය, සංවිධානාත්මක ව්‍යුහය ගොඩ නැඟීම සහ යෝග්‍ය යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම සඳහා රජය විසින් පහසුකම් සැපයිය යුතුය.

පාරම්පරික ධීවර කාර්මිකයින්ගේ සහ ධීවර වෘත්තිකයින්ගේ සංවිධාන හඳුනාගත යුතුය.

මත්ස්‍ය සම්පත් සඳහා යෝග්‍ය පරිදි අගය එක්කිරීම් කළ යුතු අතර පසු අස්වනු හානිවීම් වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

සුළුපන්න ධීවර නිෂ්පාදන ප්‍රාදේශීය ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සාධාරණ හා සමානාතමතාවයෙන් යුතු වෙළඳපොළක් වෙත ප්‍රවේශ වීම දිරිගැන්වීමට රජය පියවර ගත යුතුය.

ජාත්‍යන්තර මත්ස්‍ය වෙළඳාම දිරිගැන්වීම හේතුවෙන්, මිලෙන් අඩු මත්ස්‍ය සම්පත භාවිතයෙන් පෝෂණය සලසා ගන්නා ජනතාවගේ පෝෂණ අවශ්‍යතාවයන් සහ සමස්ථ පෝෂණ යහ පැවැත්ම අනතුරට පත් නොකළ යුතුය.

ජාත්‍යන්තර වෙළඳාමෙන් ලැබෙන ප්‍රතිලාභ සාධාරණව බෙදී යා යුතු අතර වෙළඳපොළ අවශ්‍යතාවයන් සැපිරීම සඳහා මත්ස්‍ය සම්පත අධික සූරාකෑමට ලක්කිරීම වැළැක්වීම සඳහා යෝග්‍ය කළමනාකරණ විධිවිධාන සකසා තිබිය යුතුය.

ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ ප්‍රතිපත්ති සහ විධිවිධානයන් සැකසීමේදී අදාළ අනිකුත් ඒවාට අමතරව පාරිසරික සමාජීය සහ වෙනත් අදාළ තක්සේරු කිරීම් මඟින් පරිසරයට, සංස්කෘතියට, ආහාර සුරක්ෂිතතාවයට සහ ජීවනෝපායන්ට සිදුවිය හැකි අහිතකර බලපෑම් වැළැක්වීම සඳහා ක්‍රියාකළ යුතුය.

රාජ්‍යයන් මඟින් සුළුපන්න ධීවර කර්මාන්තයේ අගය දාමය හා සම්බන්ධ සියලුම පාර්ශ්වකරුවන්ට වෙළඳපොළ හා වෙළඳාමේ තොරතුරු කාලීනවත්, නිවැරදිවත් ලබාගැනීම සඳහා අවශ්‍ය පහසුව ලබාදිය යුතුය.

## 5. ස්ත්‍රී පුරුෂ සම සාධාරණත්වය

සුළුපන්න ධීවර කර්මාන්තයේ සංවර්ධන උපාය මාර්ග තුල ස්ත්‍රී පුරුෂ සම සාධාරණත්වය, ප්‍රධාන ධාරාව තුල අන්තර්ගත කළ යුතු කරුණක් විය යුතුය.

රාජ්‍යයන් විසින් අන්තර් ජාතික මානව හිමිකම් නීතිරීති සමඟ ඇති බැඳීම් හා අනුගත වෙමින් කාන්තා ගැටලු විසඳීම සඳහා වන ජාත්‍යන්තර මෙවලම් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය.

කාන්තාවන්ට එරෙහිව සිදුවන අසාධාරණයන් පිළිබඳ ගැටලු විසඳීමට විශේෂ ක්‍රියාමාර්ග සකසා ගත යුතුය. එමෙන්ම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සමඟ සමපාත නොවන අරමුණු වෙනස්කරමින් සහ ස්ත්‍රී පුරුෂ සමානතාවය පිළිබඳ ප්‍රතිපත්තීන් සහ නීති සැකසීම තුලින් ද ස්ත්‍රී පුරුෂ සමානතාවය අත්පත් කරගත යුතුය.

කාන්තාවගේ සමාජ තත්වය ඉහළ නැංවීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟා කර ගැනීම සඳහා වූ ප්‍රතිපත්ති, ක්‍රියාමාර්ග සහ නීතිවල ඇති බලපෑම තක්සේරු කිරීමට සුදුසු ඇගයීම් ක්‍රියාවලියක් සැකසිය යුතුය.

කාන්තාවන්ගේ ක්‍රියාකාරකම් වලට වඩා යෝග්‍ය වූ තාක්ෂණයන් බිහි කළ යුතුය.

## 6. ආපදා අවදානම සහ දේශගුණික විපර්යාස

දේශගුණික විපර්යාසයන් පිටුදැකීම සඳහා කඩිනම් හා වඩාත් අභිලාෂී ක්‍රියාමාර්ග අත්‍යාවශ්‍ය වේ. කුඩා දූපත් රාජ්‍යයන්හි ජීවත්වන සුළුපන්න ධීවර ප්‍රජාවන් මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමුකළ යුතුය.

සියල්ලන් එකමුතුව සහ විවිධ ක්ෂේත්‍ර අතර ඒකාබද්ධ ක්‍රියාමාර්ගයන් තුලින් වූ සාකල්‍ය ප්‍රවේශයක් (එනම් පද්ධතියක විවිධ අංශ දෙස එකවර බැලීම) අවශ්‍යය.

ඒ සඳහා අවශ්‍ය කරන හැඩගැසීම්, ගැටලු අවම කිරීම් සහ ආධාර කිරීම් පිළිබඳව අවධානය යොමුකර, ඒ දෑ අවශ්‍ය පරිදි සැපයිය යුතුය.

මිනිසාගේ බලපෑමකින් සිදුවන ආපදාවක දී සුළුපන්න ධීවරයාට හානියක් සිදුවේ නම් අදාළ පාර්ශ්වයන්ට එහි වගකීම ගැනීමට බල කළ යුතුය.

දේශගුණික විපර්යාස වල හා ආපදාවන්හි බලපෑම විවිධ ආකාරයෙන් පසු අස්වනු තාක්ෂණය සහ වෙළඳපොළ ක්‍රියාවන්ට බලපාන ආකාරය සැලකිල්ලට ගත යුතුය.

ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමේ දී "යලිත් වඩා හොඳින් ගොඩ නගමු" යන සංකල්පය ක්‍රියාවට නැංවිය යුය.

**7. සංවර්ධනය සඳහා සාකල්‍ය ප්‍රවේශයක් තිබිය යුතු බව: මින් අදහස් කරනුයේ මුළු පද්ධතිය දෙසම අවධානය යොමුකරමින් සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතු බවය**

එහෙයින් ආයතනික සම්බන්ධීකරණය සහ සහයෝගීත්වයෙන් සුළුපන්න ධීවර ප්‍රජා සංවර්ධනය කිරීමේ ඇති අවශ්‍යතාවය රාජ්‍යයන් විසින් හඳුනා ගනිමින් විවිධ ප්‍රතිපත්ති සමපාත කිරීමේ වැඩ පිළිවෙලකට යොමුවිය යුතුය.

යෝග්‍ය අන්තර් වෙරළ කලාප කළමනාකරණ ක්‍රියාවලියක කාර්ය භාරය සැලකිල්ලට ගනිමින් හා සුළුපන්න ධීවර කර්මාන්තයේ සැබෑ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනිමින් අවකාශයේ සැලසුම් ක්‍රමවේදයන් (වෙරළාසන්න ප්‍රදේශය භාවිතය යම් ක්‍රමවේදයකට අනුව සිදුකිරීම) සකසා භාවිත කිරීමට රාජ්‍යයන් ක්‍රියාකළ යුතුය.

සාගර සහ අභ්‍යන්තර ජලාශ සහ පරිසර පද්ධතීන් හි මනා සෞඛ්‍යය තත්වයක් පවත්වා ගැනීමට හැකිවන ප්‍රතිපත්ති සකසා ගත යුතු අතර ප්‍රතිපත්තීන් අතර මනා සබඳතාවයක් පවත්වා ගැනීමට රාජ්‍යයන් පියවර ගත යුතුය.

සමුද්‍රීය සහ අභ්‍යන්තර ජල ප්‍රභව සහ පරිසර පද්ධති වලට බලපෑමක් ඇතිකරන්නාවූ විවිධ ප්‍රතිපත්ති අතර ඒකාග්‍රතාවක් ඇතිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති රජය විසින් සකස් කල යුතුය.

ජාතික ධීවර ප්‍රතිපත්තිය මගින් සුළුපන්න ධීවර කර්මාන්තයේ තිරසරභාවය සඳහා දිගු කාලීන දර්ශණයක් සැපයිය යුතුය.

සුළුපන්න ධීවර ප්‍රජාව සඳහා කරුණු පැහැදිලි කරදෙන්නාවූ ස්ථානයන් රාජ්‍ය ආයතන හා අධිකාරීන් විසින් ස්ථාපනය කළ යුතුය.

සුළුපන්න ධීවර පාර්ශවකරුවන්ගේ සංවිධාන අතර සම්බන්ධතා දිරි ගැන්විය යුතුය.

## 8. තොරතුරු අධ්‍යයන හා සන්නිවේදනය

සුළුපන්න ධීවර කර්මාන්තයේ තිරසර කළමනාකරණය සඳහා අවශ්‍ය වන තීරණ ගැනීම සඳහා අදාළ තොරතුරු රැස්කිරීමටත්, ඒ සඳහා වඩා විනිවිදභාවයෙන් යුතු වූ ක්‍රියාවලියක් ස්ථාපිත කිරීමටත් රාජ්‍යයන් ක්‍රියාකළ යුතුය.

කාර්යක්ෂමව තීරණ ගැනීම සඳහා සන්නිවේදනය හා තොරතුරු අවශ්‍ය වේ. තීරණ ගන්නා පිරිස එම තීරණවල වගකීම් දැරීමටත්, විනිවිද භාවය වර්ධනය කිරීමටත්, දූෂණය වැළැක්වීමටත් රාජ්‍යයන් උපරිම වෙහෙසක් දැරිය යුතුය.

සුළුපන්න ධීවර ප්‍රජාව දැනුම සහිත, එමෙන්ම දැනුම ලබාදෙන හා ලබා ගන්නා පිරිසක්ද වේ. වගකීමක් සහිත සුළුපන්න ධීවර කර්මාන්තයේ තිරසර භාවයට අදාළ සහ අවශ්‍ය තොරතුරු සම්පාදනය කළ යුතුය. සුළුපන්න ධීවර ප්‍රජාව සතු දැනුම ඔවුන්ගේ සංස්කෘතිය, ඔවුන්ගේ විවිධ භාවිතයන් හා තාක්ෂණය හඳුනා ගනිමින් වාර්තාගත කළ යුතුය.

යැපුම් ආර්ථිකය මත යැපෙන සුළුපන්න ධීවර ප්‍රජාවට; විශේෂයෙන්ම ස්වදේශීය ජනයාට හා කාන්තාවන්ට රජය විසින් සහය ලබාදිය යුතුය.

දැනටමත් පවත්නා වේදිකාවන් මඟින් හෝ යෝග්‍ය වේදිකාවන් සැකසීම හරහා ප්‍රජා මට්ටමේ සිට ජාතික මට්ටමට සහ ඉන් ඉහළටත් තොරතුරු විහිදී ගලා යාම සහ හුවමාරු කරගැනීම ප්‍රවර්ධනය කළ යුතුය.

සුළුපන්න ධීවර කර්මාන්තයට අදාළ පර්යේෂණ සහ දත්ත රැස්කිරීම දිරිගැන්වීමත් ඒවා විග්‍රහය හා විශ්ලේෂණය කිරීම, අදාළ සියළු පාර්ශවයන්හි සහභාගිත්වයෙන් සිදුකිරීම සඳහාත් අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට රාජ්‍යයන් පියවර ගත යුතුය.

ධීවර කර්මාන්තය තුළ කාන්තාවට හා පිරිමියාට සමානාත්මතාවයෙන් යුතුව ප්‍රතිලාභ බෙදීයාම සහතික වන ආකාරයේ උපක්‍රම අනුගමනය කිරීම සඳහා විවිධාකාරයේ පර්යේෂණ දියත්කිරීම රාජ්‍යයන් විසින් දිරිගැන්විය යුතුය.

සුළුපන්න ධීවර කර්මාන්තයේ කාර්යභාරය වටහා දෙමින් මත්ස්‍යයින් ආහාරයට ගැනීමේ පෝෂණ ප්‍රතිලාභ පිළිබඳ හඳුනාගත යුතුය. එසේම පාරිභෝගික අධ්‍යාපන වැඩපිළිවෙලක් හරහා මත්ස්‍ය ආහාර පාරිභෝජනය දිරිගැන්විය යුතුය.

## 9. ධාරිතා සංවර්ධනය

තීන්දු තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගි වීම සඳහා සුළුපන්න ධීවරයන්ට ඇති ධාරිතාවය (හැකියාව) වර්ධනය කළ යුතුය. වෙළඳපොළ අවස්ථාවන් තුලින් ඵල නෙලාගැනීම සඳහා සුළුපන්න ධීවරයන්ගේ ධාරිතාවය වර්ධනය කිරීමට රාජ්‍යයන් පියවර ගත යුතුය.

මෙම ධාරිතා වර්ධනය, සහකළමනාකරණ ක්‍රියාවලියක් සඳහාත් තිරසර සංවර්ධනයට සහය වීමට අවශ්‍ය දැනුම හා කුසලතා වර්ධනය කිරීම සඳහාත් වේ.

## 10. සුළුපන්න ධීවර කර්මාන්තය සඳහා වූ මඟපෙන්වීම් දියත් කිරීම සඳහා සහය සහ අධීක්ෂණය

සුළුපන්න ධීවර කර්මාන්තය සඳහා මඟපෙන්වීම් දියත් කිරීම සඳහා සියලුම පාර්ශ්වයන් දිරිගැන්විය යුතුය.

සුළුපන්න ධීවර මඟපෙන්වීම් මාලාව දියත් කිරීම සඳහා රාජ්‍යයන් ගන්නා ස්වේච්ඡා ක්‍රියාමාර්ග සඳහා එක්සත් ජාතීන් සහ ඔවුන්ගේ විශේෂිත ආයතන වල සහය ලබාදිය යුතුය.

රාජ්‍යයන් සහ අනිකුත් සියලුම පාර්ශ්වයන් එක්ව ක්‍රියාත්මක වෙමින් සුළුපන්න ධීවර මඟපෙන්වීම් මාලාව පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීමට සහ ඒවා පරිවර්තනය කර සරල බසින් ප්‍රචාරය කිරීමටත් පියවර ගත යුතුය.

සුළුපන්න ධීවර මඟපෙන්වීම් මාලාව ක්‍රියාත්මක කිරීමේදී, එය අධීක්ෂණ කිරීමේ ක්‍රියාවලියක ඇති වැදගත්කම හඳුනාගත යුතුය.

මඟපෙන්වීම් මාලාව සම්පාදනය කිරීමේ දී සහ අධීක්ෂණ කටයුතු දියත් කිරීමේ දී, යන අවස්ථා දෙකේදීම සුළුපන්න ධීවර ප්‍රජාව නියෝජනය කරන නීත්‍යානුකූල නියෝජිතයින් සහභාගිවිය යුතුය.